**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන අංශය**
**නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024**
**අවසාන පරීක්ෂණය**
**පස්වන මට්ටම**
**LLU5811/ LWU3314 - පරිසර නීතිය**
**කාලය- පැය තුනයි (03)**

**දිනය:20.05.2025** **වේලාව:ප.ව. 1.30 - ප.ව. 4.30**

**මුලු ප්‍රශ්න ගණාන – 07**
**ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**
අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සඳහා වූ අයිතිය යනු ජාත්‍යන්තර නීතිය තුල මනා ලෙස පිළිගන්නා ලද මානව අයිතිවාසිකමකි. 2022 වර්ෂයේදී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට පරිසරය සඳහා වූ අයිතිය මානව අයිතිවාසිකමක් ලෙස පිළිගත්තේය. සමකාලීන ලෝකය තුළ, බොහෝ රාජ්‍යයන් එක්කෝ පරිසරය සඳහා වූ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇත, එසේ නැතිනම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය අයිතියක් ලෙස එය පිළිගැනීම පිළිබඳ සලකා බලමින් සිටී. ශ්‍රී ලංකාව ද ඇතුලු දකුණු ආසියාතික රටවල් පිළිබඳ අධ්‍යයනය කරන විට පෙනී යන්නේ මෙම රටවල් තවමත් සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සඳහා වූ අයිතිවාසිකම ආරක්ෂා කිරීමට උත්සාහ කරන්නේ දැනට පවතින වෙනත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය මූලික අයිතිවාසිකම් තුලින් බවයි.

   මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ද ඇතුලත් අදාල නෛතික අධිකාරීන් ඇසුරින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. ඔබගේ විශ්ලේෂණය තුල ශ්‍රී ලංකාව සහ ඕනෑම දකුණු ආසියාතික රටවල් දෙකක (02) නෛතික තත්වය අන්තර්ගත විය යුතුය. (ලකුණු 25)

2. භූමි යනු දූපත් රාජ්‍යයක් වන අතර එහි නව ආණ්ඩුව ස්වකීය තිරසාර බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දේශීය ආයෝජකයන් සමග ආයෝජන ව්‍යාපෘතීන්වලට එළැඹීමට තීරණය කර ඇත. මේ අනුව, භූමි රාජ්‍යය 'ග්‍රීන් එනර්ජි ලිමිටඩ්' නම් වූ තිරසාර බලශක්තිය සම්බන්ධව කටයුතු කරන දේශීය සමාගමට රටේ තෝරාගත් ප්‍රදේශවල මහා පරිමාණ සූර්ය පැනල සවි කිරීමට අවසරය ලබා දුන්නේය. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස, රටේ උතුරු මැද පලාතේ මහා පරිමාණ සූර්ය පැනලයක් සවි කිරීමට ග්‍රීන් එනර්ජි සමාගම තීරණය කළේය.

   කෙසේ වුවද, රටේ පරිසර ආරක්ෂාව සහ සංරක්ෂණය සම්බන්ධව ක්‍රියා කරන සිවිල් සංවිධානයක් වන 'ග්‍රීන් ඉස් ද කලර්' නම් වූ සංවිධානය ඉහත කී ව්‍යාපෘතිය දියත් කළ පසුව 'සූර්ය බලශක්තියේ අඳුරු පැතිකඩ' නමින් වාර්තාවක් එළි දැක්වීය. මෙම වාර්තාවේ කොටසක මෙසේ සඳහන් විය : '....සූර්ය බලශක්ති ව්‍යාපෘතිය තිරසර බලශක්ති මූලයක් ලෙස සැලකෙයි. මන්ද යත් එය වායු දූෂණයට හෝ හරිතාගාර වායු විමෝචනයට හේතු නොවන බැවිනි. කෙසේ වුවද, මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් අවශ්‍ය වේ. උතුරු මැද පළාත යනු රටේ දෙවැනියට වැඩිම ජනගහණයෙන්

යුක්ත පළාත වන අතර, එය දැනටමත් විශේෂයෙන්ම අලින් සම්බන්ධයෙන් මිනිස්-වන සත්ව ගැටුමට මුහුණ දී සිටී. මෙම ව්‍යාපෘතිය මගින් තවදුරටත් වනජීවී ගහණයට හානි සිදුවිය හැකි අතර, මෙම ප්‍රශ්නය තීව්‍ර වීමට එය හේතු වනු ඇත. තවද, උතුරු මැද පළාත සතුව තිබෙන්නේ ස්වභාවික ජල මූලාශ්‍ර අල්පයකි. මේ නිසා එම පලාත බරපතල ජල හිඟයකට මුහුණ දී සිටී. මෙම මහා පරිමාණ සූර්ය පැනල ව්‍යාපෘතිය සඳහා ජල සම්පත භාවිතා කෙරෙන බැවින් එමගින් ජලය දූෂණයට ලක්විය හැකි අතර අර්බුදකාරී තත්වයක් නිර්මාණය වීමට ද හේතු වනු ඇත. උතුරු මැද පලාතේ ජනතාව ප්‍රධාන වශයේ සිය ජීවිකාව සහ රැකියා මාර්ගය ලෙස යෙදී සිටින්නේ කෘෂිකර්මයේය'. වාර්තාව අවසන් වන්නේ 'තිරසර බලශක්ති ප්‍රතිපත්තියට අනුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විට, හානිකර පාරිසරික හෝ සමාජ බලපෑම් සිදු නොවන බවට ආණ්ඩුව වගබලා ගත යුතු වෙයි' යනුවෙනි.

මෙම පසුබිම තුල, භූමි රාජ්‍යයේ නීති පද්ධතිය සහ අන්තර්ජාතික පාරිසරික බැඳීම් ශ්‍රී ලංකාවට සමාන බවත්, ඔබ ග්‍රීන් එනර්ජි ලිමිටඩ් සමාගම සඳහා මෙම ව්‍යාපෘතිය උදෙසා පත් කොට සිටින නීති උපදේශක ලෙසත් උපකල්පනය කරන්න. 'ග්‍රීන් ඉස් ද කලර්' සංවිධානයේ වාර්තාව සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර එය නෛතික අවශ්‍යතාවලට අනුව සිදු වන බවට වගබලා ගැනීම සඳහා සමාගම මෙහෙයවීම පිණිස උපදෙස් ලබා දෙන්න. ඔබගේ උපදේශය අදාල නෛතික ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීරණ මගින් තහවුරු කළ යුතුය. (ලකුණු 25)

3. 'කැළණි ගංගාව යනු දෙවැනියට විශාලතම ගංගාව වන අතර ගංගාව අසබඩ ප්‍රදේශවල සිදු වූ කර්මාන්තවල සීඝ්‍ර වර්ධනය නිසා ද, රටේ වැඩිම ජනගහණය සිටින නගරය හරහා ගමන් කරන නිසා ද ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම දූෂණයට ලක් වූ ගංගාව ද වෙයි. කොලඹ නගරයේ පානීය නල ජල ඉල්ලුමට අදාල විශාල පංගුවක් සැපයෙන්නේ කැළණි ගංගාවේ ජලය මගින් වන අතර එහි ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ අගයන් සලකා බලන විට ජල දූෂණයේ බරපතලකම පැහැදිලි වේ'.

කැළණි ගංගාවේ ජලයේ ගුණාත්මකභාවය, හැඳින්වීම, මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය.
www.cea.lk

පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 'ශ්‍රී ලංකාවේ පාරිසරික සංවර්ධනය' නම් වූ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයෙක් ලෙස ඔබව තෝරා ගෙන තිබෙන බවට උපකල්පනය කරන්න. 'ලංකාවේ දැනට පවතින ජල දූෂණය' සම්බන්ධව වාර්තාවක් ලිවීමට ඔබට භාර වී තිබේ.

ඔබගේ වාර්තාව තුල පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතුය.

- පරිසර ප්‍රශ්නය පිලිබඳ හැඳින්වීම
- ජල දූෂණය පාලනය කිරීමට හා හානි අවම කිරීමට අදාල ශ්‍රී ලංකාවේ දේශීය හා අන්තර්ජාතික බැඳීම් පිළිබඳ විස්තරය
- වැඩි වන ජල දූෂණය වලක්වා ගැනීමට රටේ දැනට පවතින නීති රාමුව ප්‍රමාණවත් නොවන්නේ ඇයි යන්න සහ ශ්‍රී ලංකාවේ ජලයේ ගුණාත්මකභාවය ඵලදායී ලෙස ආරක්ෂා කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඇතුලත් යෝජනා. (ලකුණු 25)

4. පහත දී තිබෙන ප්‍රකාශවල වලංගුතාවය අදාල නෛතික උදාහරණ සමග විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(අ) 'නිහඬ වසන්තය' කෘතියේ සිට 'දේශගුණ විපර්යාසය පාලනය සඳහා වූ අන්තර්ජාතික උත්සාහයන්' දක්වා වූ අන්තර්ජාතික පරිසර නීතියේ වර්ධනය තුල තිරසර සංවර්ධනය පිළිබඳ අදහස පිළිගැනීමට ලක්ව තිබේ'. (ලකුණු 15)

(ආ) පරිසර ආරක්ෂණයේ විවිධ පැතිකඩ පිළිබඳ සොයාබැලීම සඳහා විවිධ රාජ්‍ය ආයතන තිබුණත්, පරිසර ආරක්ෂණය, කලමණාකරනය සහ වැඩි දියුණු කිරීමට අදාලව මධ්‍යම පරිසර අධිකාරියට විශේෂ භූමිකාවක් තිබේ. (ලකුණු 10)

5. 'අන්තර්ජාතික පරිසර නීතියේ සීඝ්‍ර වර්ධනය සමග මූලධර්ම හා සංකල්ප කිහිපයක් නිර්මාණය වී තිබෙන අතර, මේවා අන්තර්ජාතික හා දේශීය යන මට්ටම් දෙකෙහිදීම අදාල කරගැනීම හා බලාත්මක කිරීම සිදු වේ'.

*Principles and Concepts of Environmental Law, Session 2, Environmental Law course material, Block 1, pg 17*

ඉහත ප්‍රකාශයේ පසුබිම තුල, සමාජයට බලපාන සමාජ-ආර්ථික ප්‍රතිවිපාක ද ඇතුලත් වන ලෙසට පරිසර ආරක්ෂණය යන්න පුලුල් ලෙස අර්ථ නිරූපණය කිරීමට විවිධ රටවල අධිකරණ පරිසර නීතියේ මූලධර්ම පිළිගෙන තිබෙන ආකාරය හා ආදේශ කොට තිබෙන අන්දම විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර තුල පහත දැක්වෙන පරිසර නීති මූලධර්ම අතුරින් දෙකක් (02) පිළිබඳ විවේචනාත්මක සාකච්ඡාවක් අන්තර්ගත විය යුතුය.

(අ) ආරක්ෂක මූලධර්මය (Precautionary Principle)

(ආ) දූෂකයා ගෙවිය යුතු බවට වූ මූලධර්මය (Polluter Pays Principle)

(ඇ) මහජන භාර සංකල්පය (Public trust doctrine) (ලකුණු 25)

6. පහත දැක්වෙන සිදුවීම්වලට අදාලව ක්‍රියාත්මක කළ හැකි දේශීය හා අන්තර්ජාතික නෛතික රාමුව හඳුනාගෙන කෙටියෙන් සාකච්ඡා කරන්න.

(අ) ලාංකීය පුරවැසියෙක්ට අයත් නෞකාවක් වන ශෙවාන් ඩුබේ නැව එරට රටේ මුහුදු තීරය මත අධික ලෙස තෙල් මුදාහරින අතර මුහුදු පත්ලේ තිබෙන ස්වභාවික සම්පත්වලට හානි සිදු වේ. (ලකුණු 10)

(ආ) සංචාරක මග පෙන්වන්නෙක් වන පියල් සිය ගනුදෙනුකරුවන් සමග, වන සතුන් ඡායාරූපගත කිරීමේ අරමුණින් යුක්තව රටේ ප්‍රසිද්ධ ජාතික සංරක්ෂිතයකට යයි. (ලකුණු 05)

(ඇ) රටේ නැගෙනහිර පළාතේ යෝජිත සංවර්ධන ව්‍යාපෘතියක් නිසා පුරා විද්‍යා ස්ථාන වෙත සෘණාත්මක බලපෑමක් ඇති වීමේ අවදානමක් ඇත. පුරාවිද්‍යා අධ්‍යක්ෂකවරයා කිසිදු තක්සේරුවක් සිදු නොකොට, සංවර්ධන ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා අදාල අවසරය ලබා දී ඇත. (ලකුණු 10)

7. සමගිපුර යනු පවුල් පනහකින් යුක්ත නේවාසික කලාපයකි. සමගිපුර ජීවත් වන නිවැසියන් නගර සභාව සමගිපුර ආසන්නයේ කුණු බැහැර කරන බවට චෝදනා කරති. මෙලෙස කසල බැහැර කිරීම නිසා කපුටන් හා අනෙක් සතුන් ඇදී ඒම වැඩි වී තිබෙන අතර, දුගඳක් ද හමන්නට පටන් ගෙන ඇත. සමගිපුර ජීවත් වන වැඩිහිටි පිරිස් හා ලමුන් නිතර අසනීප වෙති. නිවැසියන් නගර සභාව වෙත තම ප්‍රදේශයට කුණු බැහැර කිරීම සහ එහි නිශේධනීය ප්‍රතිවිපාක පිලිබඳ දැනුම් දුන් විට, මේ පිලිබඳ කිසිවක් කල නොහැකි බව පවසමින් නගර සභාව පහත දැක්වෙන තර්ක ඉදිරිපත් කළේය.

- නගර සභාවට කුණු බැහැර කිරීමට ඇති එකම ඉඩම මෙම බිම් පෙදෙස පමණි.
- සෞඛ්‍යාරක්ෂිත ලෙස කුණු බැහැර කිරීමේ විධික්‍රම නගර සභාව විසින් හඳුන්වා දෙමින් ඇත.
- කුණු එකතු කිරීමේ ක්‍රියාවලියට විකල්ප සෙවීමට අවශ්‍ය අරමුදල් සම්පාදනයට අදාල දුෂ්කරතාවයන්ට නගර සභාව මුහුණ දී සිටී.
- මෙම නිශ්චිත ප්‍රදේශයේ නිවැසියන් පනස් දෙනෙක් කුණු දැමීම සම්බන්ධව පැමිණිලි කළද, නගරයේ ජීවත් වන සිය ගණනක් වූ පවුල්වල මෙන්ම ප්‍රදේශයේ කම්කරු පාන්තික ජනතාවට රැකියා සපයන කර්මාන්තශාලා කිහිපයක කසල බැහැර කිරීමට තිබෙන එකම ස්ථානය මෙයයි.

අදාල නෛතික අධිකාරීන් උපුටා දක්වමින් සමගිපුර නිවැසියන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 25)

**හිමිකම් ඇවිරිණි**